IHRA
UNIVERSITY OF COLOMBO

106

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2016/2017

(ප්‍රථම සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2018 නොවැම්බර්)

## BLE 302 - ජනගහන අධ්‍යයනය සහ මිනිස්බල සැලසුම්කරණය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) **ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුයි.**

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. i. ශ්‍රම අධ්‍යයන සහ ජනහගහන අධ්‍යයනය අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කර, ජනගහන අධ්‍යනයහි ඇති සමාජීය සහ ආර්ථික වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. රටක ජනගහන වර්ධනය පාලනය කළ යුත්තේ කුමන හේතු නිසාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. ජනගහන අධ්‍යයනයන්හිදී දත්ත ලබාගත හැකි ප්‍රධාන මූලාශ්‍ර මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

02. i. යම්කිසි ජනගහනයක වයස් සහ පුම්තිරි ව්‍යුවහයේ සිදුවන වෙනස්කම් එම රටෙහි සංවර්ධනය කෙරෙහි කරනු ලබන බලපෑම උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. ප්‍රජා විද්‍යා සංක්‍රාන්ති න්‍යාය යනු කුමක්දැයි පැහැදිලි කර, ශ්‍රී ලංකාවේ ජනගහන වෙනස්වීම් අධ්‍යනය කිරීම සඳහා ප්‍රජා සංක්‍රාන්ති න්‍යාය කෙසේ යොදාගත හැකිදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

03. i. සාපලයතා විභේදන මොනවාදැයි කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

ii. යම්කිසි රටක සාඵල්‍යතා මට්ටම එම රටෙහි ශ්‍රම සැපයුම කෙරෙහි කුමන ආකාරයෙන් බලපෑම් කරන්නේ දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. රටක සාඵල්‍යතාවය පාලනය කිරීම සඳහා ගතහැකි ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ග මොනවාදැයි නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

04. i. "රටක මර්ත්‍යතා දර්ශක එම රටෙහි ජනහගහනය සහ සංවර්ධනය පිළිබඳ කැඩපතකි." මෙම ප්‍රකාශනය උදාහරණ සහිතව විභාග කරන්න.

(ලකුණු 10)

ii. රටක මර්ත්‍යතාවය ඉහළ යාම කෙරෙහි බලපාන සාධක මොනවාදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

05. සංක්‍රමණය පිළිබඳ තල්ලුකිරීමේ සහ ඇද ගැනීමේ න්‍යාය කෙටියෙන් පැහැදිලි කර සංක්‍රමණ කෙරෙහි බලපාන තල්ලුකිරීමේ සාධක (Push Factors) සහ ඇද ගැනීමේ සාධක (Pull Factors) කවරේදැයි ශ්‍රී ලංකාව ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

06. ජාත්‍යන්තර සංක්‍රමණ නිසා රටකට ඇතිවන සමාජීය සහ ආර්ථික බලපෑම උදාහරණ සහිතව ශ්‍රී ලංකාව ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

07. i. "කිසියම් රටක වියපත් ජනහගහනය ඉහල යාම එම රටෙහි සංවර්ධනය කෙරෙහි කුමන ආකාරයේ බලපෑමක් ඇති කරන්නේදැයි විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ii. ජනහගහන ප්‍රතිපත්ති සහ සංවර්ධනය අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

08. පහත සඳහන් මාතෘකා අතරෙන් කැමති ඕනෑම මාතෘකා හතරක් (04) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. ඌන සේවා නියුක්තිය (Under Employment)
ii. ශ්‍රම සංක්‍රමණ (Labour Migration)
iii. ජනහගහ පිරමීඩ (Population Pyramids)
iv. දළ උපත් අනුපාතිකය (Crude Birth Rate) සහ මුළු සාඵල්‍යතා අනුපාතිකය (Total Fertility Rate)
v. බාල යැපුම් අනුපාතිකය (Younger Dependency Ratio) සහ වයස් යැපුම් අනුපාතිකය (Old Dependency Ratio)
vi. ජීවන අපේක්ෂාව(Life Expectancy)
viii. ලෝක පද්ධති න්‍යාය (World System Theory)

(ලකුණු 5 x 4 - 20)

*****